දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011- 2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info @psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PSC/APL/09/93/2023
ඔබේ අංකය / உமது இல. / Your No.:

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

දිනය / திகதி / Date: 2024.02. 15

**ලේකම්**
අධ්‍යාපන අමාත්‍යාංශය

**<u>2022/2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**
**<u>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය</u>**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ 2022/2023 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ www.psc.gov.lk දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කර ඇත.

02) ඒ අනුව වහාම එකී ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලෙසත්, නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි. එසේම මීළඟ වර්ෂයේ සිට වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී ස්ථාන මාරු පටිපාටියෙහි දක්වා ඇති කාල සටහනට අනුගතව සියලු කටයුතු කිරීමට තරයේ සැලකිලිමත් වන ලෙස ඔබ වෙත දැන්වීමටද රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන ලද බව කාරුණිකව දන්වමි.

03) එමෙන්ම, බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ හැර අනෙකුත් පළාත් රාජ්‍ය සේවයන්ගේ සේවයේ නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන්ගේ ස්ථාන මාරු පිළිබඳ තත්ත්වය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වාර්තා කරන ලෙස ඔබ වෙත දැන්වීමටද රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇති බව මෙයින් දන්වා සිටිමි.

04) තවද, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 2024 වර්ෂය සඳහා වන ස්ථාන මාරු ක්‍රියාපටිපාටිය සම්බන්ධ කටයුතු මෙතෙක් ආරම්භ වී නොමැති බව නිරීක්ෂණය වන හෙයින්, 2024 මාර්තු මාසයෙන් ආරම්භ කර 2025 ජනවාරි 01 දින සිට බලාත්මක වන පරිදි සැකසූ, 2024 වාර්ෂික ස්ථාන මාරු කාල රාමුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙසද ඔබට දැන්වීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන ලද බව දන්වා සිටිමි.

05) එමෙන්ම, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථානමාරු නියෝගයන්ට එරෙහි අභියාචනා ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් නිලධාරීන්ගේ දැනුවත්භාවය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය කළ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථානමාරු පටිපාටියෙහි **අභියාචනා ක්‍රියා පටිපාටිය** කෙරෙහි අවධානය යොමු කරන මෙන් අදාල නිලධාරීන් දැනුවත් කරන ලෙස ඔබට දැන්වීමට තීරණය කරන ලද බව වැඩිදුරටත් දන්වා සිටිමි.

06) එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමක් සිදු නොකෙරෙන අතර, අදාල තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව දන්වා සිටිමි. මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

07) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බවද කාරුණිකව දැනුම් දෙමි.

08) 2022/2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන් වහාම නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙසද ඔබ වෙත දන්වා සිටිමි.

09) වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 (V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැරයාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

10) එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිම.

Mdaya

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අභියාචනා -2022/2023 සම්බන්ධ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ**

| අනු අංකය | මුලකුරු සමග නම | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලද පාසල/ සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 1 | ඩී.ආර්.එන්.කේ.ගමගේ මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.I | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | ශ්‍රී සුමංගල විද්‍යාලය (පිරිමි)- පානදුර | 2024.07.01 දින සිට ස්ථාන මාරුව ක්‍රියාත්මක කිරීම |
| 2 | බී.ඩී.වික්‍රමතිලක මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.I | අධ්‍යාපන අමාත්‍යාංශය | බස්නාහිර පළාත් රාජ්‍ය සේවය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 3 | ඩී.එම්.එල්.වී.දසනායක මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.III | කො/ දේවි බාලිකා විද්‍යාලය- කොළඹ 8 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 4 | ඩබ්ලිව්.ජී.කේ.එම්.එස්. රත්නායක මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.II | අධ්‍යාපන අමාත්‍යාංශය | බස්නාහිර පළාත් රාජ්‍ය සේවය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 5 | ඩී.එල්.එස්. දංගල්ල මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.I | අධ්‍යාපන අමාත්‍යාංශය | බස්නාහිර පළාත් රාජ්‍ය සේවය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 6 | පී.ලියනගේ මයා | ශ්‍රී.ලං.අ.ප.සේ.I | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | බස්නාහිර පළාත් රාජ්‍ය සේවය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 7 | ඊ.එන්. බොරලුගොඩ මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.II | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | බස්නාහිර පළාත් රාජ්‍ය සේවය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 8 | කේ.සී.එස් ද සිල්වා මයා | ශ්‍රී.ලං.අ.ප.සේ.II | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | බස්නාහිර පළාත් රාජ්‍ය සේවය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 9 | එස්.අයි. සුබසිංහ මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.II | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | බස්නාහිර පළාත් රාජ්‍ය සේවය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |

14/02/2024

14/02/2024

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අභියාචනා -2022/2023 සම්බන්ධ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ

| අනු අංකය | මුලකුරු සමග නම | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලද පාසල/ සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 10 | එල්.ජී.ඩී.ධම්මිකා කුලතුංග මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.II | බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | අධ්‍යාපන අමාත්‍යාංශය | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරු වක්‍රය අවලංගු කිරීම |
| 11 | ඩබ්.කේ.එස්.එස්. පෙරේරා මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.I | අධ්‍යාපන අමාත්‍යාංශය | බස්නාහිර පළාත් රාජ්‍ය සේවය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 12 | කේ.ජී.එල්.නිරීෂා මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.I | අධ්‍යාපන අමාත්‍යාංශය | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 13 | ජී.ජී.ජේ.ජේ. අමරතුංග මෙනවිය | ශ්‍රී.ලං.අ.ප.සේ.II | අනුලා විද්‍යාලය - නුගේගොඩ | බස්නාහිර පළාත් රාජ්‍ය සේවය | අභියාචනයට ඉඩ දෙමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට ස්ථාන මාරු කිරීම |
| 14 | ජේ.අතුකෝරල මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.II | අනුලා විද්‍යාලය - නුගේගොඩ | බස්නාහිර පළාත් රාජ්‍ය සේවය | ස්ථාන මාරු වක්‍රය අවලංගු කිරීම |
| 15 | ජී.ආර්.එස්.පෙරේරා මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.I | අධ්‍යාපන අමාත්‍යාංශය | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | අභියාචනය ප්‍රතික්ෂේප කිරීම |
| 16 | අයි.එම්.සේනාධීර මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.II | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | අධ්‍යාපන අමාත්‍යාංශය | |
| 17 | ටී.එම්.ජී.එස්. තෙන්නකෝන් මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.I | අධ්‍යාපන අමාත්‍යාංශය | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | |
| 18 | ටී.ටී. නානායක්කාර මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.I | කලාප අධ්‍යාපන කාර්යාලය- ශ්‍රී ජයවර්ධනපුර | අධ්‍යාපන අමාත්‍යාංශය | |

14/02/2024 14/02/2024

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අභියාචනා -**2022/2023** සම්බන්ධ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ

| අනු අංකය | මුලකුරු සමග නම | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලද පාසල/ සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 19 | කේ. කේ. කුමුදුනී මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.I | කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය | දේවි බාලිකා විද්‍යාලය-කොළඹ 08 | අභියාචනය ප්‍රතික්ෂේප කිරීම |
| 20 | එච්.ඒ.කේ.යූ.අයි. හෙට්ටිආරච්චි මයා | ශ්‍රී.ලං.අ.ප.සේ.I | කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | |
| 21 | එච්.ඩී.ඒ.එම්. හිඳුරංගල මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.I | කලාප අධ්‍යාපන කාර්යාලය-පිළියන්දල | ස්ථාන මාරු ලබා දී නොමැත | |
| 22 | ආර්.එම්.එම්. ඒ. රත්නායක මිය | ශ්‍රී.ලං.අ.ප.සේ.I | ශ්‍රී ජයවර්ධනපුර කලාප අධ්‍යාපන කාර්යාලය | අධ්‍යාපන අමාත්‍යාංශය | |

14/02/2024

14/02/2024